**ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූනි 22 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

## 2.1 විසර්ජන ගිණුම

---

### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 880.20 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 784.79 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 95.41 ක් හෙවත් සියයට 10.84 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 584.20 | 579.23 | 4.97 | 0.85 |
| මූලධන | 296.00 | 205.56 | 90.44 | 30.55 |
| **එකතුව** | **880.20** | **784.79** | **95.41** | **10.84** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අමාත්‍යාංශ 28 ක් හා දෙපාර්තමේන්තු 18 ක් විසින් එකතුව රු.මිලියන 2,094 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,709 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 385 ක් හෙවත් සියයට 18.39 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 25901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 45.00 | 44.92 | 30.00 | 38.15 | 150.00 | 130.10 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 06 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 219.39 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0054/000 | 6.15 |
| 6000/0000/00/0002/0072/000 | 3.53 |
| 6000/0000/00/0013/0044/000 | 25.65 |
| 6000/0000/00/0016/0024/000 | 109.05 |
| 6000/0000/00/0017/0005/000 | 74.54 |
| 6000/0000/00/0018/0031/000 | 0.47 |
| **එකතුව** | **219.39** |

## 2.4 විගණන නිරීක්ෂණය

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | නාඋල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ii) | ගලේවෙල හා අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (iii) | අඹන්ගඟ කෝරළේ, දඹුල්ල හා පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විදුලි උපකරණ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක ස්ථාවර වත්කම් ලේඛන | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි |
| (v) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | යාවත්කාලීන කර නොතිබුණි . |
| (vi) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1647 | යාවත්කාලීන කර නොතිබුණි . |

## 3.2 විසර්ජන ගිණුම

### 3.2.1 අයවැය විචලනය

වැය විෂයයන් 04ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21ක සිට සියයට 48 ක් දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 08 කින් මූලධන වැය විෂයයන් 08 ක් සඳහා ලබාදී තිබුණු රු.මිලියන 264.42 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 135.00 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) 2016 වර්ෂයේ යටවත්ත හා මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විමධ්‍යගත සංවර්ධන යෝජනා යටතේ මිලදී ගන්නා ලද වර්ග 05 ක ක්‍රීඩා භාණ්ඩ ඒකක 38 ක් බෙදා හැරීමෙන් තොරව ගබඩාවේ පැවතුණි.

(ඇ) 2016 වර්ෂයේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන මත නාඋල ඕපල්ගල වරාගොල්ල ගම් සහා මාර්ගය මීටර් 125 ක් දුරට කොන්ක්‍රීට් කිරීම සඳහා රු.692,520කට ගිවිසුම්ගතව වැඩ නිමකර තිබුණි. මෙම මාර්ගයේ එක් පැත්තක සමතලා කිරීම සඳහා රු.26,790 ක් ගෙවා තිබුණද, එහි මිනුම් ලබාගත් ආකාරය පැහැදිලි කිරීමට අපොහොසත් වූ අතර ලබාගත් මිනුම් අනුව පැති කාණු කැපීමේදී රු.5,380 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) නාඋල ඕපල්ගල වරාගොල්ල මාර්ගයේ පෙට්ටි බෝක්කුවක් ඉදිකර තිබුණද ඉහළින් ගලන ජලය බෝක්කුව තුළට ඇතුළු වුවත්, ජලය පිටතට ගලාඑන පරිදි කානුව නිසි පරිදි සම්බන්ධ කර නොතිබීමෙන් ජලය කාණුව දිගේ පහළට ගලා බැසීමක් සිදු නොවන බැවින් රු.73,120 ක් වැයකර ඉදිකරන ලද බෝක්කුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(ඉ) නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිකුල බොබැල්ල මාර්ගයේ (පංසල පාර) ආරම්භක කොටස සංවර්ධනය කිරීම සදහා රු.1,088,516 ක් ගෙවා තිබුණද, මාර්ගයේ කාණුව කොන්ක්‍රීට් කිරීමේදී පතුල සදහා මීටර් කියුබ් 1.537ක් කොන්ක්‍රීට් අඩුවෙන් යොදා තිබීමෙන් රු. 24,241 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) 2014 වර්ෂයේ ආරම්භකර 2016 වර්ෂය වන විට රු.6,265,078 ක වියදම් කර තිබුණු හබරගහමඩ අත්යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථානය සම්බන්ධව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගොඩනැගිල්ල අධිබලැති විදුලි රැහැන් පද්ධතියකට පහළින් ඉදිකර තිබුණි.
(ii) ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි.
(iii) ගැල්වනයිස් හා යකඩ භාවිතා කර ගොඩනැගිල්ල ඉදිකර තිබුණි.
(iv) අසාමාන්‍ය උසකින් යුත් වහලයේ වඩිම්බු ගසා නොතිබුණි.
(v) දුර්වල කොන්ක්‍රීට් මිශ්‍රණය හේතුවෙන් පොළව පුපුරා තිබුණි.
(vi) බිත්ති ඉරිතලා තිබුණි.
(vii) කාණු පද්ධතිය සකස් නොකර සිමෙන්ති හෝ ඒ සමාන මිශ්‍රණයක් ඇතිරීම සිදුකර තිබුණි.
(viii) සමස්ථයක් ලෙස ගොඩනැගිල්ලේ නිර්මාණකරණය, භූමිය තෝරා ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම, ඉදිකිරීම් අධීක්ෂණය හා සම්පත් භාවිතයට ගැනීම ඉතා දුර්වල මට්ටමක පැවති අතර 2017 ජූනි මාසය වන විටද මෙම ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයට යොදාගෙන නොතිබුණි.

(උ) හබරගහමඩ පේෂකර්ම ව්‍යාපෘතිය සඳහා නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේදී රු.1,456,607 ක් වැයකර මිලදී ගෙන තිබුණු මහන මැෂින් 43 කින් 23ක් හා කතුරු 11 ක්ද ඒ සඳහා මිලදී ගෙන තිබුණු කමිස රෙදි යාර 240 ක් හා නූල් පන්දු 48 ක්ද වර්ෂ 02 කට වැඩි කාලයක සිට දිරාපත් වෙමින් නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවතුණි.

(ඌ) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ටී.බී.තෙන්නකෝන් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.11,786,165 ක් වැයකර තිබුණි. එහි ඉඩම සම්බන්ධව පැවැති මතභේදකාරී තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් නවතා 2016 වර්ෂයේ ලද ප්‍රතිපාදන ආපසු යවා තිබුණි. 2017 ජූනි මාසය වන විට ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ මූලික ආකෘතියට අදාළ වැඩ කොටස් ඉටුකර වර්ෂ 2 ක් මුළුල්ලේ විනාශවීමට ලක්වෙමින් පැවති අතර, මෙය අරමුණුගත කාර්යය ඉටු නොවූ ව්‍යාපෘතියක් බවට පත්වී තිබුණි.

(එ) ගොඩනැගිල්ල ඉදිකරන භූමියේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගෙන ව්‍යාපෘති ආරම්භ කරන ලෙස උපදෙස් දී තිබුණි. 2014 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ තිත්තවැල්ගොල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පෞද්ගලික හිමිකම් ඇති ඉඩමක් විධිමත් පරිදි පවරා නොගෙන රු.457,332ක් වැයකර සායන/ කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි.

(ඒ) නාඋල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ලිහිණිපිටිය ජල යෝජනා ක්‍රමය පුළුල් කිරීමක් වශයෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් සහ අවිච්ඡේද මුදල් ලෙස ලද ප්‍රතිපාදනයෙන් 2016 වර්ෂයේදී මීටර් 1053 ක් දුරට ජලනළ එළීම සඳහා රු.2,292,855 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පරීක්ෂාවට ලක් කළ කොටස්වල ගල්කුඩු දමා නොතිබුණි.

(ii) අඩි 03 ක් ගැඹුරට කපා වැලි අතුරා ජල නල එළිය යුතු වුවද, ස්ථාන කීපයකදී එම ජල නල පොළොව මතුපිට පැවතුණි.

(iii) ජල නල එලා ඇති මාර්ගයේ ජී.අයි. බට සම්බන්ධ කිරීමට පී.වී.සී බට යොදා තිබුණි.

(iv) 2017 ජූලි 19 දින වන විටද ජලය ලබා දී නොතිබුණි.

(ඔ) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේ පළාත් නැගුම වැඩසටහන යටතේ ඇල්කඩුව නගරයේ ක්‍රීඩාපිටියක් ඉදිකිරීම සඳහා රු.5,100,000 ක ප්‍රතිපාදනවලින් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.4,281,688 ක් වැය කර තිබුණි. ක්‍රීඩා පිටියේ බැම්ම සම්පූර්ණයෙන් නිමකර නොතිබුණු අතර පස් සෝදා යෑමක්ද සිදුවී තිබුණි. මේ නිසා ක්‍රීඩාපිටියක් ලෙස භාවිතයට ගෙන නොතිබුණු බවත්, මුදල් සම්පූර්ණයෙන් උපයෝජනය කර තිබුණද මහජනතාවට ලබාදීමට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඕ) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2014 වර්ෂයේ ගම නැගුම සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ අඩක් වැඩ නිමකර තිබුණු උඩංගමුව ප්‍රජා ශාලාව සඳහා 2015 වර්ෂයේදී හා 2016 වර්ෂයේදී ප්‍රතිපාදන ලබානොදීම නිසා 2014 වර්ෂයේදී වැය කළ රු.254,416 ක මුදල නිෂ්කාර්ය වියදමක්වී තිබුණි.

(ක) 2012 වර්ෂයේදී රු.866,539 ක වැය කර ආරම්භ කළ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඕපල්ගල ජල යෝජනා ක්‍රමය සඳහා 2014 වර්ෂයේ රු.1,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. ජල මූලාශ්‍රයේ ප්‍රමාණවත් ජලය නොමැතිවීමෙන් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ග) පවුල් 161 කට හෙවත් ප්‍රතිලාභීන් 558 දෙනෙකුට ජලය ලබාදීමේ අරමුණින් ආරම්භ කළ නාඋල මොරගහමඩ පානීය ජල ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයේදී රු.500,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.64,050 ක් පමණක් වැයකර තිබුණි. 2016 වර්ෂයේදී රු.342,500 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත අවිච්ජේද ව්‍යාපෘතියක් ලෙස නම් කර ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් රු.300,000 ක්ද ලැබී තිබුණි. ජලනළ එළීම, ජල මූලාශ්‍රය ආශ්‍රිත ළිඳට පැති බැම්මක් ඉදිකර නව ජල සැපයුම් සම්බන්ධතාවය ලබාදීමට රු.564,725 ක් ගෙවා තිබුණි. ජල මූලාශ්‍රයේ ඉදිකිරීම් දුර්වලතාවය නිසා ජල නළවල රොඩු හා රොන්මඩ සිරවී තිබුණි. ඒ හේතුවෙන් ජලය ගලා ඒමත් සිදු නොවන බැවින් ජලය බෙදාහැරීමක් සිදු කර නොතිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 2ක කාලයක් ඉක්මවූ එකතුව රු.5,889,053ක් වූ තැන්පතු 137ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.297,410 ක මුදල් අදාළ කාර්යයන් සඳහා යෙදවීමෙන් හෝ නිරවුල් කිරීමෙන් තොරව 2016 දෙසැම්බර් 31 දින වන විටත් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 25901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.730,710 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 15 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වි තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු.8,584ක ණය මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| | | | වර්ෂ |
| (i) | ගොඩනැගිලි | 02 | 02 |
| (ii) | මෝටර් බයිසිකල් | 07 | 17 |
| (iii) | යන්ත්‍ර සූත්‍ර | 03 | 02 |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 ජූනි 30 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2015 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ii) 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අනුව විකිණීමට නියම කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක තක්සේරු වටිනාකම රු.88,685 ක් වූ භාණ්ඩ ඒකක 116 ක් සම්බන්ධයෙන් විගණන දිනය වූ 2017 ජනවාරි 31 වන විටත් මුදල් රෙගුලාසි 772(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-----------------------------------------

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ නව පරිපාලන සංකීර්ණය ඉදිකිරීමට පැරණි ගොඩනැගිලි කඩා ඉවත් කිරීම හේතුවෙන් පරිශ්‍රයේ පැවති කාර්යාල 06 ක් පෞද්ගලික අංශයේ ගොඩනැගිලිවල ස්ථාපනය කර ඒ සඳහා වර්ෂයකට රු.2,126,400 කට කුලී ගෙවමින් පැවැතුණි. නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ ඇති වර්ග අඩි 368 ක වපසරියෙන් යුත් ගොඩනැගිල්ලක් 2002 වර්ෂයේ සිට සේවා මුක්ත භට සංගම් කාර්යාලයටද, වර්ග අඩි 64 ක වපසරියකින් යුත් ගොඩනැගිල්ලෙන් විශ්‍රාමික සංගමයටද කිසිදු ගෙවීමකින් තොරව වර්ෂ 14 කට අධික කාලක සිට ලබාදී තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 1 කට අඩු කාලයක සිට පැවැත එන බැරකම් රු.3,611,510 ක් විය.

**3.7 අනුකූල නොවීම්**

--------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | මුදල් රෙගුලාසි 880 | 98,500 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඇප තැබිය යුතු නිලධාරීන් 12 දෙනෙකු ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| | 2015 ජූනි 14 දිනැති අංක 03/2015 චක්‍රලේඛය | 492,460 | අදාළ කාර්ය අවසන් කර දින 10 ක් ඇතුළත අතුරු අග්‍රිම පියවිය යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළුව යටවත්ත හා ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 27 කදී නිකුත් කර තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම දින 11 ක සිට දින 61 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. |
| **(ඇ)** | **ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය** | | |
| | 2015 ජූලි 07 දිනැති අංක BD/GPS/130/9/14/MC-ii දරන ලිපියේ 02 වන ඡේදය | 554,000 | යටවත්ත හා අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යලවල සේවයේ යෙදී සිටි සංවර්ධන නිලධාරිනියන් සිව් දෙදෙනෙකු යතුරු පැදි හිමි නොවන ගුරු වෘත්තිය හා රාජ්‍ය කළමනාකරණ සේවය සඳහා ස්ථිරවම මුදාහැර තිබුණද, යතුරුපැදිවල වෙළඳපල වටිනාකම එම නිලධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණි. |
| **(ඇ)** | **ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කළ නිවේදන** | | |
| | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටි රීති 1 වැනි කාණ්ඩයේ xvii පරිච්ඡේදයේ 202 විධිවිධාන | - | මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වර්ෂ 06 ක සිට වර්ෂ 24 ක් දක්වා සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් 05 දෙනෙකු සේවයේ නිරත වී තිබුණි. |

## 3.8 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

ගලේවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් කඳන්ගමුව පාසල් මාවත සංවර්ධනය කිරීම සඳහා රු.300,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, පැරණි ඇස්තමේන්තුව අනුව මාර්ගය සංවර්ධනය කිරීම අපහසු බව කොන්ත්‍රාත්කරු විසින් දන්වා තිබීම හේතුවෙන් එම කර්මාන්තය ආරම්භ නොකර අත් හැර තිබුණි.

### (ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක් විසින් පහත සඳහන් පරිදි ව්‍යාපෘති 11ක් ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය<br>රු. | ආරම්භ කළ දිනය | 2016 දෙසැම්බර් 31 දින වන විට වියදම<br>රු. | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|---|
| (i) | මාතලේ හන්දියේ සිට පත්කොළගොල්ල පාර | 2,000,000 | 2014 | 392,000 | මහ නගර සංවර්ධන සැලැස්ම යටතේ මාර්ගය පුළුල් කිරීම |
| (ii) | තිත්තවැල්ගොල්ල සායන/ කායවර්ධන මධ්‍යස්ථානය | 1,000,000 | 2014 | 457,331 | ඉඩමේ අයිතිය පවරා නොගැනීම |
| (iii) | බණ්ඩාරපොල මහා විද්‍යාලයේ පාසල් ගොඩනැගිල්ල | 8,250,000 | 2014 | 1,588,006 | කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය නිම කිරීමට අපොහොසත්වීම |
| (iv) | සැළගම ක්‍රීඩාපිටිය සංවර්ධනය | 490,870 | 2014.10.11 | 425,956 | බැම්මක් ඉදි කළයුතු අතර ඒ සඳහා අධික වියදමක් කිරීමට සිදුවී තිබුණි |
| (v) | දළුවෙල සේවා මධ්‍යස්ථානය ඉදිකිරිම | 261,274 | 2014.10.12 | 146,780 | ඉඩම නිරවුල් නොවීම |
| (vi) | උඩගම ජල යෝජනා ක්‍රමය | 1,000,000 | 2014.10.30 | 575,118 | ප්‍රදේශයේ ගොවි ජනතාවගේ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | විරෝධයක් ඇතිවීම |
| (vii) | කළල්පිටිය ගංගොඩ ගමට ජලදිගුවක් ලබාදීම | 150,603 | 2014.10.13 | - | නව වැඩ කොටසක් කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම |
| (viii) | රංගම වැලිකොටුව ග්‍රාමීය මාර්ගයේ පැතිබැම්මක් ඉදිකිරීම | 2,196,000 | 2014.12.10 | - | ව්‍යාපෘතිය සඳහා කාලය ප්‍රමාණවත් නොවීම හා ප්‍රමාණවත් ප්‍රතිලාභීන් ප්‍රමාණයක් නොමැතිවීම |
| (ix) | මකුලේමඩ මාණික්කාවත්ත මාර්ගය සංවර්ධනය කිරීම | 784,000 | 2014 | 500,000 | නව වැඩ කොටස් ඉටු කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම. |
| (x) | ගලඋඩහේන හා බ්‍රැන්ඩිගල ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීම | 5,000,000 | 2014 | 1,311,652 | පාරිසරික විරෝධය |
| (xi) | ටී.බී. තෙන්නකෝන් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම- දඹුල්ල | 43,446,598 | 2014 | 11,786,165 | ඉඩම සම්බන්ධව පවතින ගැටළුකාරි තත්ත්වය |

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

-----------------------------------------------------------------

ඉදිකිරීම් සම්බන්ධව විවිධ ආයතනවලට සහ ලංකා විදුලිබල මණ්ඩලය වෙත මුදල් නිදහස් කර ඇති නමුත් වැඩ පිළිබඳ නිසි ප්‍රගතියක් නොමැති අවස්ථා පහත දක්වා ඇත.

(i) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විදුලි දිගු 02 ක් වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.980,952 ක මුදලක් ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවා තිබුණද 2017 ජූනි මාසය වන විටද විදුලි සැපයුම ලබාදී නොතිබුණි.

(ii) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගලඋඩහේන සහ බ්‍රැන්ඩිගල ප්‍රදේශය සංචාරක කළාපයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා රු.5,000,000 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. මූලික උද්‍යාන කටයුතු ආරම්භ කිරීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට හා අනෙකුත් මූලික කටයුතු ඉටුකිරීම වෙනුවෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන වෙත 2014 දෙසැම්බර් 31 දින වන විට රු. 1,311,652 ක් ගෙවා තිබුණි. ,2017 මැයි මාසය වන විටද කිසිදු නිර්මාණ කටයුත්තක් සිදුකර නොතිබුණි.

**3.9** **කාර්යසාධනය**

----------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) රු. මිලියන 550 ක ඇස්තමේන්තුවක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට නව පරිපාලන සංකීර්ණයක් ඉදිකිරීමට 2011 වර්ෂයේ යෝජනා වී තිබුණි. 2013 වර්ෂයේදී රු. මිලියන 09 ක් ද, 2015 වර්ෂයේ රු.මිලියන 150 ක් ද, 2016 වර්ෂයේ රු. මිලියන 200 ක්ද, වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 123.67 ක වියදමක් පමණක් කර තිබුණි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් මෙම ඉදිකිරීම් කාර්යය ඉටු කළ යුතුව තිබුණත්, ඉදිකිරීම් සම්බන්ධව පවතින මන්දගාමී ස්වභාවය සහ සැලැසුම් සහගත වැඩ සටහනකට අනුව ඉදිකිරීම් සිදු නොකිරීමෙන් 2015 හා 2016 වර්ෂවල සලසා තිබුණු ප්‍රතිපාදන පිළිවෙලින් රු.මිලියන 140.5ක්ද හා රු.මිලියන 86 ක්ද. ප්‍රතිපාදන ඉතිරි කර තිබුණු අතර 2016 වර්ෂයේ ප්‍රතිපාදනවලින් රු.මිලියන 86 ක්ද ඉතිරි කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ රු.396,175 ක වැය කර රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ වැට ඉදිකර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- එම කොන්ක්‍රීට් කනු පිරිවිතරයන්ට අනුකූල වි නොතිබුණි.
- කොන්ක්‍රීට් කනු ඉදිකළ පාදම ශක්තියෙන් අඩුවිම.
- පිරිවිතරයන්ට අනුකූල නොවූ දැලක් හා ජී.අයි බට යොදා තිබුණි.
- කටුකම්බි පොටවල් ශක්තිමත්ව ඇද නොතිබුණි.

**(ආ)** **සැලැසුම් කිරීම**

-----------------

2016 වර්ෂය වෙනුවෙන් 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව කෘෂිකර්ම ඒකකය මගින් වැඩසටහන් 05 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණද, ඒ සඳහා ප්‍රතිපාදන නොලැබීම නිසා එම වැඩසටහන ආරම්භ කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැසුමට පරිබාහිරව යෝජිතව තිබූ පලතුරු ගම්මාන 05 ක් සැකසීමේ ව්‍යාපෘතියෙන් පලතුරු ගම්මාන 03 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

**3.10** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මිල නියම කිරීමේ කමිටුව විසින් ඉදිකිරීම් ද්‍රව්‍යයන්, කම්කරු ගාස්තු හා ප්‍රවාහන ගාස්තුවල මිල ගණන් නියම කිරීමේදී අසාමාන්‍ය ලෙස වැඩි මිල ගණන් නියම කර තිබුණි. මේ නිසා වැඩි මිල ගණන් යොදා ඇස්තමේන්තු සකස් කිරීමෙන් ඒවායේ පිරිවැය ඇස්තමේන්තුව වැඩි වටිනාකමක් වීමෙන් ඉහළ වටිනාකම්වලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් රජයට විශාල මූල්‍ය පාඩුවක්ද සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

**3.11 අවිධිමත් ගනුදෙනු**

--------------------

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

---------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය අනුව ජාතික තරඟකාරි ලංසු කැඳවීමේදී දින 21 ක කාලයක් ලබාදිය යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටුකරන ලද රු.24,005,704 ක් වටිනා කර්මාන්ත 03කට ලංසු කැඳීවීමේදි දින 14 ක කාලයක් ලබාදී තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 මාර්ගෝපදේශය අනුව ලංසු ලියාපදිංචි තැපැල් මගින් හෝ මුද්‍රාතබන ලද කවරයක් යටතේ ඉදිරිපත් කළයුතු වුවද යටවත්ත, ගලේවෙල, මාතලේ හා නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රු.1,144,417 ක මිලදී ගැනීම්වලට අදාළ ප්‍රසම්පාදනයන් සඳහා ලංසු කැඳවීම එසේ සිදු කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 මාර්ගෝපදේශය ප්‍රකාර අදාළ පිරිවිතර හා මිලදී ගන්නා භාණ්ඩ ප්‍රමාණයන් සඳහන් නොකර උකුවෙල හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රු.282,150 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

**3.12 පාඩු හා හානි**

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකු වෙත ලබා දී තිබූ රු.88,665 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් හා රු.56,000 ක් වටිනා ටැබ් යන්ත්‍රයක් අස්ථාන ගතවී තිබුණත්, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිපුණතා ප්‍රවර්ධන ඒකකයේ තිබූ රු.87,994 ක් වටිනා පරිගණක යන්ත්‍රයක් අස්ථානගතවී වර්ෂ 04 ක කාලයක් ගතවී තිබුණද ඒ සම්බන්ධව ලබා දී තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.13 අනාර්ථික ගනුදෙනු**

------------------------

මාතලේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් මාතලේ මහනගර සභාව ඉදිරිපිට ඇති පැරණි " සාක්ෂි මඩුව " ගොඩනැගිල්ල 1980 වර්ෂයේ සිට වාර්ෂික බදු බලපත්‍රයක් මත මහනගර සභාවට බදු දී තිබුණි. 1997 හා 1998 වර්ෂවලට අදාළ අයවිය යුතු හිඟ බදු මුදලද ඇතුළත්ව 2016 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු මුළු හිඟ බදු මුදල රු.190,400 ක් වී තිබුණත්, එම හිඟහිටි බදු මුදල 2017 ජුනි මාසය වන විටද අයකර ගෙන නොතිබුණි.

## 3.14 විසඳා නොතිබුණු විගණන ඡේද

--------------------------------

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පසු විපරම් කටයුතු නිම නොවූ ඡේදවලට යොමු පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමු ගත විෂය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2007 | 7.5(අ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා |
| 2008 | 7.4(ඇ) | නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම |
| 2010 | 4.10(අ) | අනාර්ථික ගනුදෙනු |
| 2011 | 4.10 (අ) | අනාර්ථික ගනුදෙනු |
| 2012 | 1.7 | වත්කම් කළමනාකරණය |
| 2014 | 3.5 (අ) | වත්කම් කළමනාකරණය |
| 2015 | 3.6(ආ) | වත්කම් කළමනාකරණය |
| 2015 | 3.9(අ)(i) | ප්‍රධාන කාර්යන්ට පටහැනි ක්‍රියාකාරකම් |
| 2015 | 3.12(ඇ) | අනාර්ථික ගනුදෙනු |

## 3.15 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) රජයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉඩම් පවරා ගැනීමේදී මාතලේ, දඹුල්ල, අඹන්ගඟ කෝරළේ, පල්ලේපොල, රත්තොට හා උකුවෙල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අවස්ථා 54 කදී වර්ෂ 02 සිට වර්ෂ 35 ක් දක්වා කාල ප්‍රමාදයක් සිදුවී තිබුණත්, පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල, උකුවෙල, නාඋල හා ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වර්ෂ 01ක සිට වර්ෂ 34 ක් දක්වා කාල ප්‍රමාදයකින් යුතුව ජනාධිපති වරයා විසින් අත්සන් කර තිබූ ජය භූමි, ඉසුරු භූමි හා ස්වර්ණ භූමි දීමනා පත්‍ර 273ක් දීමනා පත්‍ර ලාභීන්ට බෙදාහැරීමට කටයුතු නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවාගෙන තිබුණි.

## 3.16 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යා

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 63 | 49 | 14 |
| (ii) | තෘතියික මට්ටම | 36 | 23 | 13 |
| (iii) | ද්විතියික මට්ටම | 1,643 | 1,450 | 193 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 131 | 111 | 20 |
| | **එකතුව** | **1,873** | **1,633** | **240** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 240ක් පැවැති අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම පුරප්පාඩු විධිමත් පරිදි පිරවීමට කටයුතු කර නොතිබුණි.

### (ආ) නිෂ්කාර්ය මානව සම්පත්

ඔස්ට්‍රේලියානු රජය මගින් ප්‍රදානය කළ පශ්චාත් උපාධියක් හැදෑරීම සඳහා යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් 2014 හා 2015 වර්ෂවල අධ්‍යාපන නිවාඩු ලබා ගෙන තිබූ අතර, ප්‍රසූත නිවාඩු ලබාගැනීමෙන් අනතුරුව ඇය 2016 අගෝස්තු 15 දින සිට මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රාජකාරියට වාර්තා කර තිබුණි. 2017 ජූනි මාසය දක්වා එම නිලධාරියා වෙත කිසිදු රාජකාරියක් පැවරීමකින් තොරව රඳවාගෙන සිටි අතර ඇයට 2016 දෙසැම්බර් 31 දින වන විට වැටුප් ලෙස රු.326,719 ක් ගෙවා තිබුණි.